නිපුණතාව 10 - ශ්‍රී ලංකා ගෙවුම් ශේෂ අසමතුලිතතා හඳුනා ගනිමින් ඒ සඳහා විසඳුම් හා ක්‍රියාමාර්ග යෝජනා කරයි.

## නිපුණතා මට්ටම 10.6 - විදේශ විනිමය අනුපාතික ක්‍රම තුලනාත්මකව විග්‍රහ කරයි.

ප්‍රධාන වශයෙන් විනිමය අනුපාත ක්‍රම දෙකකි.

1.ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය
2.නම්‍ය විනිමය අනුපාතික ක්‍රමය

**1.ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය-** මූල්‍ය අධිකාරිය විසින් තීරණය කළ විනිමය අනුපාතිකය නැවත මූල්‍ය අධිකාරිය විසින්ම වෙනස් කරන තෙක් ම එකම මට්ටමක පවතින්නේ නම් එය ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය ලෙස හඳුන්වයි.

- ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමයට පදනම් වූයේ රන් මිනුම් ක්‍රමය හා රන් හුවමාරු ක්‍රමයයි.එනම් රන් සංචිත ක්‍රමය මත ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ පදනම වේ.

### ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය රටකට වාසිදායක ලෙස බලපාන ආකාරය

1.විනිමය අනුපාතිකය ස්ථාවර නිසා ආනයනකරුවන්ට ඇතිවන අවදානම අඩුය.
2.විනිමය අනුපාතිකය ස්ථාවර නිසා විදේශ ආයෝජකයන්ට විදේශ ණය සැපයුම්කරුවන්ට ඇතිවන අවිනිශ්චිත බව අඩුය.
3.ස්ථාවර විනිමය අනුපාතිකයක් පවතින විට සමස්ත ආර්ථිකයේ ක්‍රියාකාරීත්වයන් කළමනාකරණය කිරීමේ හැකියාව වැඩිය.
4.ස්ථාවර විනිමය අනුපාතිකයක් පවතින විට සමපේක්ෂණ චේතනාවෙන් විදේශ ව්‍යවහාර මුදල් ඉල්ලුම් කිරීමට නොපෙළඹෙන නිසා විදේශ විනිමය හිඟයක් ඇති නොවේ.
5.විනිමය අනුපාතිකයේ වෙනස්වීම මගින් අපනයනකරුවන්ට වාසි ලබා ගත නොහැකි බැවින් අපනයනවල තරඟකාරීත්වය ඉහළ නංවා ගැනීමට අපනයනකරුවන් පෙළඹෙයි.

### අභ්‍යාස

1.ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය රටකට අවාසිදායක ලෙස බලපාන ආකාරය පැහැදිලි කරන්න.
2.නම්‍ය විනිමය අනුපාතිකය යනු කුමක්ද?
3.නම්‍ය විනිමය අනුපාතික ක්‍රමයේ වාසි හා අවාසි දක්වන්න.